# ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් කෙරෙහි ජනතාවගේ ඇති දැඩි රුචිකත්වය

**ඒ. ඒ. එම්. කේ. අමරසිංහ**[1]

## සංක්ෂේපය

පුද්ගලයෙකුට යහපත් දිවිපෙවෙතක් ගත කිරීම සඳහා නිරෝගිමත් බව අත්‍යාවශ්‍ය සාධකයක් බවට වර්තමානයේ පත්ව ඇත. පුද්ගලයෙකුගේ සෞඛ්‍යය සම්පන්න බව එරට අනාගතය තීරණය කිරීමෙහිලා වැදගත් සාධකයකි. එහිදී ජනතාව නීරෝගී වීම උදෙසා ප්‍රතිකාර හා උපදෙස් නිසි අයුරින් ලැබෙනවා ද යන්න පිළිබඳ ගැටලුවක් පැනනගී. මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් කෙරෙහි ජනතාවගේ ඇති දැඩි රුචිකත්වය පිළිබඳ විමර්ශනය කර ඇත. මේ උදෙසා මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි පෞද්ගලික රෝහලක් වන මෙඩි සෙවන සහ රජයේ රෝහල කරා ඇදී එන රෝගීන් 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් පහසු නියැදීම් ක්‍රමය යටතේ තෝරාගෙන ඇත. දත්ත ලබා ගැනීම සිදු කරනු ලැබුවේ, සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙනි. මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වූයේ, එම ප්‍රදේශය තුළ පෞද්ගලික රෝහල් ආරම්භ වීමත් සමඟ විශාල රෝගීන් සංඛ්‍යාවක් ඒ කරා ඇදී ඒමත් , ඒ තුළින් පුද්ගලයන්ගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි ගුණාත්මක තත්ත්වයෙන් යුතු ප්‍රතිකාර හා උපදෙස් , කාර්යක්ෂම මෙන්ම සුහදශීලී සේවාවක් ලැබී ඇති බවත් ය. කෙසේ වුවද, මෙම පෞද්ගලික රෝහල් නිසා රජයේ රෝහල් කරා පුද්ගලයන් ඇදී යාමේ ප්‍රවණතාවය අඩු වී ඇත. එයට හේතුව වී ඇත්තේ, රජයේ රෝහල් වල ඇති අකාර්යක්ෂම බව , අකාරුණික බව හා කාලය නිකරුණේ නාස්ති කිරීම යනාදී කරුණු බව හෙළි විය. මේ හේතුවෙන් බොහොමයක් පුද්ගලයින් පෞද්ගලික රෝහල් කරා ඇදී යාමේ දැඩි රුචිකත්වයක් ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** සෞඛ්‍යය, පෞද්ගලික රෝහල්, රජයේ රෝහල්, රෝගීන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, k.amarasinghe92@gmail.com